වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு, மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு
Ministry of Trade, Commerce, Food Security and Co-operative Development

අංක 492, ආර්.ඒ. ද මැල් මාවත, කොළඹ 03. இல. 492,ஆர் ஏ.டி. மெல் மாவத்தை, கொழும்பு 03. No. 492, R.A.D. Mel Mawatha, Colombo 03.

මගේ අංකය / எனதுஇல / My No: MOT/MU/0054

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2026/03/09

මාධ්‍ය නිවේදනය.

රු. 10,000 දක්වා වැඩි කළ මහපොළ ශිෂ්‍යත්ව දීමනාව හෙට(10) සිට බැංකු ගිණුම් වෙත.

2026 අයවැය යෝජනා අනුව වැඩි කළ ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (MTF) විසින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා පිරිනමනු ලබන මාසික මහපොළ ශිෂ්‍යත්ව දීමනාව ජනවාරි මාසයේ සිට බලාත්මක කර තිබේ.

ඒ අනුව මීට පෙර පැවති රු. 7,500 ක මහපොළ ශිෂ්‍යත්ව දීමනාව රු. 10,000 දක්වා වැඩිකර ඇත.

2026 ජනවාරි මාසයට අදාළ රු. 10,000 ක ශිෂ්‍යත්ව දීමනාව හෙට(10) දින සිට අදාළ සිසුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කිරීමට කටයුතු යොදා ඇති අතර ඒ පිළිබඳ ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විශ්‍රාමික විනිසුරු විජිත් මළල්ගොඩ මහතාගේ නිවේදනය මේ සමඟ අමුණා ඇත.

ස්තුතියි.

සමීර ප්‍රභාෂ් විජේසිංහ
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ
මාධ්‍ය ලේකම්
අංකය 492, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

සමීර ප්‍රභාෂ් විජේසිංහ
මාධ්‍ය ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය.

දූරකථන தொலைபேசி இல Telephone: 011 -2118653
ඊ-මේල් மின்னஞ்சல் E-mail: media@trademin.gov.lk

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
லலித் அத்துலத்முதலி மஹபொல உயர்க்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
LALITH ATHULATHMUDALI MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

8 වන මහල, සකොස මහලේකම් ගොඩනැගිල්ල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02, ශ්‍රී ලංකා.
8வது மாடி ,சதொச செயலகக் கட்டிடம் இல 27,வொக்ஹோல் வீதி,கொழும்பு 02.
8TH Floor, CWE Secretariat Building, No.27, Vauxhall Street, Colombo 02, Sri Lanka

මගේ අංකය / எனது இல / My No. MTF/1/5/Press

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026.03.09

ප්‍රවෘත්ති නිවේදනය

මහපොළ ශිෂ්‍යත්ව දීමනාව රු. 10,000 දක්වා වැඩි කිරීම

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2026 අයවැය ප්‍රකාශය මඟින් යෝජනා කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (MTF) විසින් විශ්වවිද්‍යාල සිසුන්, දෙමාපියන් සහ අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම්දෙනු ලබන්නේ මහපොළ මාසික ශිෂ්‍යත්ව දීමනාව රු. 7,500 සිට රු. 10,000 දක්වා වැඩි කර ඇති බව සහ එය 2026 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන බවයි.

මෙම වැඩි කිරීම 2026 අයවැය ප්‍රකාශය මඟින් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද, උසස් අධ්‍යාපනය හදාරන උපාධි අපේක්ෂක සිසුන්ට මූල්‍ය සහය ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළක කොටසක් ලෙස ක්‍රියාත්මක කර ඇත. එමඟින් විශ්වවිද්‍යාල සිසුන් මුහුණ දෙන මූල්‍ය බර අඩු කිරීම හා සුදුසුකම් ලත් සිසුන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය සහය සැපයීම අරමුණු කර ගෙන ඇත.

මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් ලලිත් අතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) හරහා මහ භාණ්ඩාගාරය විසින් ඒකාබද්ධව පිරිවැය දරනු ලබයි. වත්මන් විධිවිධාන අනුව ශිෂ්‍යත්ව දීමනාවේ 48% ක් මහපොළ භාර අරමුදල විසින් ද, ඉතිරි 52% ක් රජය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ද දරනු ලබයි.

තවද 2025 අප්‍රේල් මාසයේ සිට 2026 ජනවාරි දක්වා කාලය තුළ මහපොළ ශිෂ්‍යත්ව දීමනාව දෙවරක් සංශෝධනය කර ඇති අතර, එමඟින් රු. 5,000 සිට රු. 10,000 දක්වා, රු. 2,500 බැගින් වූ වැඩිවීම් දෙකක් මඟින්, වත්මන් රජය යටතේ ශිෂ්‍යත්ව දීමනාව දෙගුණ කර ඇත.

2026 ජනවාරි මාසයට අදාළ රු. 10,000 ක මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම 2026 මාර්තු 10 වන දින සිසුන්ගේ අදාළ බැංකු ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

මහපොළ භාර අරමුදල ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍ය සහය තවදුරටත් ශක්තිමත් කරමින් රටේ මානව සම්පත් සංවර්ධනයට දායක වීමට අඛණ්ඩව කැපවී සිටී.

සභාපති
ලලිත් අතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
කොළඹ
09.03.2026

CamScanner

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
லலித் அத்துலத்முதலி மஹாபொல உயர்க்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
LALITH ATHULATHMUDALI MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

8 වන මහල, සකොස මහලේකම් ගොඩනැගිල්ල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02, ශ්‍රී ලංකා.
8வது மாடி ,சதொச செயலகக் கட்டிடம் இல 27,வொக்ஷொல் வீதி,கொழும்பு 02.
8TH Floor, CWE Secretariat Building, No.27, Vauxhall Street, Colombo 02, Sri Lanka

මගේ අංකය எனது இல My No. MTF/1/5/Press	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி 2026.03.09 Date

PRESS RELEASE

Increase of Mahapola Scholarship Allowance to Rs. 10,000

In implementing the Budget 2026 proposal presented by His Excellency the President of Sri Lanka, the Lalith Athulathmudali Mahapola Higher Education Scholarship Trust Fund (MTF) is pleased to inform university students, parents, and all other interested stakeholders that the monthly Mahapola Scholarship allowance has been increased from Rs. 7,500 to Rs. 10,000 with effect from January 2026.

This increase forms part of the Government's broader initiative announced in the 2026 Budget Speech to strengthen financial support for undergraduate students pursuing higher education in Sri Lanka. The decision reflects the Government's continued commitment to easing the financial burden on university students and ensuring that deserving students receive adequate assistance to continue their academic studies.

The Mahapola scholarship payment is jointly funded by the Mahapola Higher Education Scholarship Trust Fund (MTF) and the University Grants Commission (UGC) through the General Treasury. Under the current arrangement, 48% of the scholarship installment is borne by the Mahapola Trust Fund, while 52% is funded by the Government through the UGC.

Accordingly, the Mahapola scholarship installment has been revised twice between April 2025 and January 2026, resulting in the scholarship allowance being doubled from Rs. 5,000 to Rs. 10,000, through two equal increments of Rs. 2,500 introduced under the present Government.

The January 2026 Mahapola scholarship payment of Rs. 10,000 will be credited to the respective student bank accounts on 10 March 2026,

The Mahapola Trust Fund remains committed to strengthening financial assistance for university students and supporting the development of human capital in Sri Lanka.

Chairman
Mahapola Higher Education Scholarship Trust Fund
Colombo

09.03.2026

දුරකථන/தொலைபேசி/Tel: 0112685011, ෆැක්ස්/பெக்ஸ்/Fax: 0112675524, Web : www.mahapola.lk, Email : mahapola@mahapola.lk

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ ස්ථාපිතයි. மஹாபொல உயர்க்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியமானது 1981 ஆம் ஆண்டின் 66 ஆம் இலக்க சட்டத்தினால் தாபிக்கப்பட்டதாகும். Established under Mahapola Higher Education Scholarship Trust Fund Act No.66 of 1981.

CamScanner